# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

- 2014 දෙසැම්බර්
- මෙත් සවිය
  - එකොළොස් වන කාණ්ඩය
- විසිහතර වන කලාපය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.  දු: ක: 0714 0144 67, 0112 50 50 88
වෙබ් අඩවිය : www.methsaviya.lk / www.methsaviya.org  විද්‍යුත් තැපෑල : office@methsaviya.org

නිතින් මෙත් සිතින් මම වෙසෙම් වා
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා




මෙත් සවිය
මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය
හෙළදිවට බුදුහිමි වැඩමකර
වසර 2600 ක් සපිරීම
නිමිතිකොට
2012/01/08 වන
දුරුතු පොහෝ දින
ඓතිහාසික මහියංගන
රාජමහා විහාර පුදබිමෙහි
අඩි 84 ක් උසැති
බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙලීම
මෙත් සවිය විසින් අරඹන ලදී.
ඇස්තමේන්තු ගත මුදල
රුපියල් ලක්ෂ 350 ක්
පමණ වේ.
මෙම අටමහා කුසල කර්මයට ඔබත් දායකවීමට කැමති නම් විමසන්න
0714 0144 67, 0112 50 50 88
office@methsaviya.org

# මෙත් සවිය

මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ - 06.

දු:ක: 0714 014467, 0112 505088 වෙබ් අඩවිය : www.methsaviya.org / www.methsaviya.lk විද්‍යුත් තැපෑල : office@methsaviya.org


## අප ගැන වචනයක්

**මෙත් සවිය සංසදය** නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශාක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලාංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් වසර දහයකට පෙර අරඹන ලද සාමාජිකයින්ගේ එකතුවකි. වර්තමාන සාමාජික සංඛ්‍යාව 4500 ඉක්මවා ඇත. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදාළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයින් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මේ මගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයින්ගේ කැමැත්ත / ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමාකරණය, නායකත්වය, ත්‍රෛමාසික චිත්ත සංයම අභයාස හා භාවනා වැඩසටන් වැනි ඒ ඒ කාලවලදී පවත්වන වැඩසටහන් සඳහා සහභාගිවීමේ වරප්‍රසාධය සියලු සාමාජිකයින්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයින්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන - ශීල - භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් මාංශ භක්ෂණයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය ප්‍රධාන මූලස්ථානය පවත්වා ගනිමින් "මෙත් සවිය" මෛත්‍රී සංසදය පසුගිය දශකය පුරා සමථ විපස්සනා භාවනාවන් හාරදහස් පන්සීයකට අධික පිරිසකට උගන්වා ඇති අතර, ශාසන අභිවෘද්ධිය වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර ඇත. මීට අමතරව බෞද්ධ භාවනාවේ ප්‍රයෝජනය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ පවත්වමින් දෙස් විදෙස් ජාත්‍යන්තර සම්මන්ත්‍රන වලට එම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරනු ලබන, අප දන්නා පරිදි ලංකාවේ ඇති එකම ආයතයද "මෙත් සවිය" වේ. (මින් සමහරක් අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැක). තවද මිරිසවැටිය සළපතල මළුව ප්‍රතිසංස්කරණය ආරම්භ කිරීම, නාගදීප වන්දනාවේ යන බැතිමතුන්ගේ පහසුව සඳහා වසර 30 ක දිගු යුද්ධය නිම වී මාස 06 ක් යාමට පෙර නාගදීපය සහ කිළිනොච්චියේ ලුම්බිණි විහාරයේ වැසිකිළි පද්ධතීන් සාදා නිම කොට පූජා කිරීම. මහියංගන රජමහා විහාරයේ ලක්ෂයට වැඩි පිරිසකට පිරිසිදු ජලය පානය කළ හැකි ජල පිරිපහදුවක් සාදා පූජා කිරීම. ගෞතම බුදුරජාණන් වහන්සේ ලොව පහල වීම සහ බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවී 2600 ක් ඉක්මවීම සැමරීම සඳහා අසූහාරදහසක් ධර්මස්කන්ධය සිහි වන අයුරින් ඓතිහාසික මහියංගන රජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති "2600 සම්බුද්ධ ජයන්ති සමරු බුදු පිළිමය" ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම, එසේම රෝද පුටු පරිත්‍යාග කිරීම, කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල හා මහරගම පිළිකාරෝහල ඇතුලු රෝහල් ගණනාවකට අවශ්‍ය උපකරණ ලබාදීම වැනි ලොකු කුඩා සත්කාරයන් රැසක් පසුගිය වසර පුරා ඉටුකර ඇත.

**සියලු ලෝ සතුන්ගේ සිත්තුල මෛත්‍රිය පැතිරේවා.....!**

### මෙත් සවිය 2014 සඳහා පත් වූ විධායක කමිටුව

**ගරු පැවිදි අනුශාසක**

ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත
වංසාලංකාර අමරපුර නිකායේ
ගරු අධිකරණ සංඝනායක අතිපූජ්‍ය අහංගම
ආනන්ද මහා ස්ථවිරයන් වහන්සේ

**ගරු සභාපති**

විද්‍යා කීර්ති, ශාසනදීපන, ලෝකාර්ථචාරී,
විද්‍යාවාචස්පති, දේශමාන්‍ය,
විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදී,
නාලන්දා කීර්ති ශ්‍රී මහාචාර්ය චන්දන ජයරත්න
මහතා.
දු . ක: 0714 800 800 / 0777 309 385
ෆැක්ස් : 0115 678 000
විද්‍යුත් තැපෑල
chandanajayatne@gmail.com

**ගරු උප සභාපතිවරු**

වෛද්‍ය ධම්මික ආරියනන්ද මහතා
විපුලතේජ විශ්වනාත් අපෝන්සු මහතා

**ගරු සම ලේකම්වරු**

අජිත් නිශාන්ත මහතා
දු. ක: 0714 467 272
රොෂාන් බොතේජු මහතා

**ගරු භාණ්ඩාගාරික**

දිනේෂ් අමරසූරිය මහතා

**ගරු උප භාණ්ඩාගාරික**

කපිල රොෂාන් ඉලේපෙරුම මහතා

**ගරු සංස්කාරක**

පත්මකුමාර ජයසිංහ මහතා

**පරිගනක සංස්කාරක සහ වෙබ් අඩවි කළමණාකරු**

චින්තක බණ්ඩාර මහතා

**ගරු කාරක සභිකවරු**

සුරේෂ් කෞශල්‍ය මහතා
ජී. පී. තිලකසිරි මහතා
වික්‍රම ගුණදාස මහතා
එච්. පී. කේ. එදිරිසිංහ මහතා
අසංක කෝසල එදිරිසිංහ මහතා
හදජිත් පෙරේරා මහතා

### සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

**2015 ජනවාරි මස පළමු දින වසරේ ප්‍රථම හීල් දානය**

**2015/01/01** - හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ දී, වර්ෂය ආරම්භකිරීම නිමිති කොටගෙන පවත්වන හීල් දානමය පුණ්‍යකර්මය සඳහා පෙ.ව. 6.30 ට ගංගාරාමයට පැමිණෙන්න.

**2015 ජනවාරි මස පළමු දින ජයන්ති ළමා නිවාසයට දහවල් දානය හා උපකරණ ලබාදීම**

**2015/01/01** - ජයන්ති ළමා නිවාසයට දහවල් දානය සහ අවශ්‍ය උපකරණ පරිත්‍යාග කිරීම සිදු කෙරේ. කැමති පින්වතුන් පෙ.ව. 11.30 ට බෞද්ධාලෝක මාවතේ සමස්ථ ලංකා බෞද්ධ මහා සම්මේලනය පිටුපස ඇති ජයන්ති ළමා නිවාසයට පැමිණෙන්න.

**2015 වසර සඳහා නොමිළයේ බෙදා හරිනු ලබන මෙත් සවිය දින දර්ශනය**

2015 මෙත් සවිය දින දර්ශනය අප කාර්යාලයෙන් දැන් ලබාගත හැක.

**2015 පෙබරවාරි 01 ඉරු දින පැවැත්වෙන දාන - සීල - භාවනා සඳහම් චාරිකාව හා මහියංගනය බුදුපිළිමය නෙළීම අධීක්ෂණය සඳහා සහ දඹාන ආදී වාසින්වෙත ආධාර ලබා දීම සඳහා වන සඳහම් චාරිකාව**

2015 ජනවාරි 31 රාත්‍රී 10.00 ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් අධි සුඛෝපබෝගී බස් රථ වලින් පිටත්වන අප පෙබරවාරි 01 වන දින අළුයම 4.00 ට මහියංගනය රාජමහා විහාරයට ගොස් භාවනා කිරීම, කප්රුක් පූජාව සහ කිරි ආහාර පූජාවක් චෛත්‍යට පූජා කිරීම සහ බුදු පිළිමය ඉහළට නැංවීමේ වැඩ ආරම්භය සිදුකිරීම නිමා කොට, පෙ.ව. 9.00 ට ලංකාවේ අවසන් මහරහතන් වහන්සේ වැඩ සිටි ගල්ලෙන් සහිත දඹාන මාවරගල ආරණ්‍යය සේනාසනය වෙත ගොස් දාන - ශීල - භාවනා වැඩසටහනේ යෙදී, ප.ව. 2.00 ට දඹාන ආදී වාසින් වෙසෙන වැදි ගම්මානයට ගොස් ඔවුනට ආධාර සිදු කොට, සාම්ප්‍රදායික කිරි කොරහ වැදි නැටුම බලා නැවත ප.ව. 9.00 ට පෙර වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයට ආපසු ලගා වීටම බලාපොරොත්තු වේ. **සහභාගී වීම සඳහා 03 වන පිටුවෙහි විස්තරය බලන්න.**

## ... සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### 2015/03/01 ඉරු දින - සාර්ථක ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වන ක්‍රම පිළිබඳ වන වැඩමුළුව

සාමපිකයින් සඳහා සහ ඔවුන්ගේ දරුවන් සඳහා නොමිලයේ පැවැත්වෙන මෙම ඉතා වැදගත් වැඩසටහන ප.ව 1 සිට ප.ව 5 දක්වා බොරැල්ල YMBA ශාලාවේ දී පැවැත්වේ. මිනිසා විසින් උපතේ සිට මරණය දක්වා නොකඩවා සිදුකරන ක්‍රියාවලියක් වන ඉගෙනීම නිසි පරිදි සිදු කරන අයුරු පැහැදිලි කරන මේ වැඩමුළුව ළමා හා වැඩිහිටි සියලු දෙනාටම වැදගත්ය. මෙත්සවිය සංසදයේ සාමාජිකයින් හා ඔවුන්ගේ දරුවන් සඳහා නොමිලයේ පවත්වන සාර්ථකව ඉගෙනීම හා විභාග සමත් වීමේ නවීන ක්‍රමවේද පිළිබඳ වැඩමුළුවට ඔබට හා ඔබේ දරුවාට ද සහභාගී විය හැක. සාමාජික භවතා සමඟ නොපැමිණ ළමුන් තනිව පැමිණෙන්නේ නම් උප්පැන්න සහතිකයේ පිටපතක් හා සාමාජිකයාගේ ලිපියක් රැගෙන ආ විට නොමිළයේ සහභාගි විය හැකිය. එක් සාමාජිකයෙක් සඳහා එක් මුද්‍රිත සටහනක් පමණක් සැපයේ. සාමාජික නොවන බාහිර සිසු සිසුවියන්ට හා අන් අයටද සහභාගී විය හැකි අතර මුද්‍රිත ද්‍රව්‍ය හා ශාලා ගාස්තු සඳහා යන බරපැන පියවීම සඳහා එවැනි අයෙකු විසින් රු. 500/- ක මුදලක් එදිනට ආයෝජනය කල යුතු වේ. මේ සඳහා 2015-02-25 දිනට පෙර 0714 0144 67 හෝ 0112 50 50 88 අමතා ලියාපදිංචි වන්න. වයස 12 ට වැඩි ඕනෑම අයෙකුට සහභාගී විය හැකිය. පාඩම් කිරීමේ නවීන ක්‍රම, වේගයෙන් ලිවීමේ, කියවීමේ ක්‍රමවේද, ඉගෙනීමට බාධාවන මානසික රෝග හඳුනාගැනීම, මතකය වර්ධනය සඳහා ක්‍රියාමාර්ග, බුද්ධි වර්ධන අභ්‍යාස, කාලසටහන් තැනීම, ස්වයං යෝජනා ක්‍රම හා විභාගයකදී සමත් වීමට පිළිතුරු ලියන පිළිවෙල ආදී වැදගත් කරුණු රාශියක් මෙහි දී ප්‍රායෝගිකව හඳුන්වා දේ. සාමාජික කණ්ඩායම් අංක 1 සිට 28 දක්වා මීට ඉහත දී මෙම වැඩසටහනට සහභාගී වී ඇති සාමාජිකයින් ඔවුන් වෙත ඇති මුද්‍රණ සටහන් රැගෙන ඒමට කාරුණික වන මෙන් ඉල්ලා සිටිමු.

### 2015/03/22 වන ඉරුදින 31 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන ආරම්භය.

මීළඟ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන. 2015 - 03 - 22 වන ඉරු දින ආරම්භ වීමට නියමිත අතර, ඒ සඳහා ඉල්ලුම්පත් 2015 - 02 - 28 දින දක්වා බාර ගැනේ. මේ සඳහා සහභාගී වීමට බලාපොරොත්තු වන සාමාජිකත්වය අලුත් කරගත් පැරණි සාමාජිකයින්ට 2015 - 02 - 28 දිනට ප්‍රථම ඒ බව කාර්යාලයට දන්වන්න.

### 2015 අප්‍රේල් 05 වන ඉරු දින මෙත් සවිය, වාර්ෂික මහ සභා රැස්වීම / ධර්ම දේශනාව සහ මෛත්‍රීභූෂණ සම්මාන උලෙළ.

2015 අයවැය ඉදිරිපත් කිරීම හා නව නිලධාරි මණ්ඩලය පත්කර ගැනීම කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ ධම්මගවේශී බෞද්ධ ආශ්‍රමයේදී, ධර්ම දේශනාව අවසානයේදී පැවැත්වේ. එදින සාකච්ඡා සඳහා නව යෝජනා ඇති නම් 2015 - 03 - 5 දිනට පෙර කාර්යාලයට භාර දෙන්න. මෙතෙක් සාමාජිකත්වය අලුත් නොකර ඇති සියලුම දෙනා වාර්ෂික මහා සභා රැස්වීමට පළමුව සාමාජිකත්වය අලුත් කරගන්නා මෙන් ඉල්ලමු. එදින අනුපමේය සේවයක් කර ඇති පුද්ගලයින්ට මෙත් සවිය ගෞරව උපහාර සම්මාන පිරිනැමීමට බලාපොරොත්තු වේ. **නව නිලතල සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය 13 වන පිටුවෙහි පළකර ඇත.**

### පළමුවෙනි ඉරුදින මාසික රැස්වීම

සෑම මසකම පළමුවෙනි ඉරුදින සිරිත් පරිදි අනිවාර්යයෙන් දාන - සීල - භාවනා වැඩසටහන් සඳහා (සදහම් චාරිකාවේ නොයෙදෙන දින වලදී) මාසික රැස්වීම් සහ විශේෂ දේශනය කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශි බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. එහෙයින් දැන්වීමක් ලැබුන ද නොලැබුන ද සෑම මසකම පළමුවන ඉරුදින (සදහම් චාරිකාවල යෙදෙන දින වලදී හැර) ඉහත මාසික රැස්වීම් සඳහා ප.ව. 2.00 - 4.00 අතර කාලය තුල පැමිණෙන ලෙස සියලු සාමාජිකයින්ගෙන් මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටින්නෙමු. ඉදිරි වැඩ සටහන් පිළිබඳ තොරතුරු වෙබ් අඩවියෙන් ද ලබාගත හැක. මෙම වැඩ සටහන් සඳහා දිවයිනෙහි සුප්‍රසිද්ධ ධර්මදේශක ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වැඩම කරවීම හෝ පෞරුෂ වර්ධන යෝග වැඩසටහන් ආදී විශේෂිත වැඩසටහනක් හඳුන්වාදීම සඳහා ගිහි භවතකු හට හෝ ආරාධනා කිරීම කරනු ලැබේ. මේ සඳහා වන සාමාජිකයන්ගේ යෝජනා වෙතොත් සභාපති / ලේකම් තුමා වෙත දන්වන්න.

### පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන්න.

පුස්තකාලයෙන් ලබා ගත් පොත් නැවත ලබා දෙන මෙන් සියළුම සාමාජිකයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

### මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

### අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

2015- 02- 01 වන දින සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය කාර්යාලයට එම මුදල් භාර දී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

### මීළඟ මෙත් සවිය සඟරාවේ එල කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එල කරනු ලබන දැන්වීම් භාර ගැනීම

මීළඟ මෙත් සවිය සඟරාවේ එල කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ එල කරනු ලබන දැන්වීම් 2015 - 03 -15 දිනට පෙර සභාපතිතුමා වෙත හෝ කාර්යාලයට හෝ භාර දෙන්න.

### නොමිළයේ බෙදා හරිනු ලබන ස්වයංජාත ඇල් වී පැල ලබාදීම

ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරනා ඒ.එන්.පී.මැන්ඩිස් මහතාගේ සම්බන්ධීකරණයෙන්, ලෝකයේ සත්ත්වයා හටගත් කාලයේ තිබුනා යැයි අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වන පොතු නැති, ගොඩ හැදෙන පවුලකට එක් පැලයකින් වසරක් පුරා අවශ්‍ය සහල් ප්‍රමාණය ලබා දෙන සුවිශේෂී ඇල් වී වර්ගයේ පැල 2 ක් සාමපිකත්වය පවත්වාගෙන යන මෙත්සවිය සාමාජිකයින් හට වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ කාර්යාලයට පැමිණ ලබා ගැනීමට කටයුතු යොදා ඇත. ක්ෂනිකව වැවෙන බැවින් ඉක්මනින් පැමිණ ලබා ගන්න.



*"ඒකල්හි කුඩු රහිත වූ දහයියා, (පොතු) රහිත වූ සුවඳ ඇත්තා වූ සහල්ම ඵලකොට ඇත්තා වූ හැල් පහල වූයේය"* - අ. සූ.

## සුව සෙත

**ප්‍රාණ / විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් පුද්ගලයින් විසින්**

**රෝග සුවකිරීමේ නොමිළයේ පැවත්වෙන සුව සෙත වැඩසටහන**

**ඉරු දිනවල දී පෙ.ව. 11.00 - 2.00 දක්වා**

**(මාසයේ පළමු ඉරු දින හැරෙන්නට) ශ්‍රී විජයාරාමයේ දී.... පැවත්වේ.**

කාර්යයාලයෙන් හෝ කමිටු සභාපති ප්‍රභාත් විජේසිංහ (0777 328 565) මහතාගෙන් විමසා පැමිණෙන්න.

## දාන - සීල - භාවනා සදහම් චාරිකාව, මහියංගනය බුදුපිළිමය තෙළීම අධීක්ෂණය / පිළිමය ඉහළට නැංවීම ආරම්භය සහ දඹාන ආදී වාසින් වෙත ආධාර ලබා දීම.


- අපගේ මීළඟ ත්‍රෛමාසික දාන - ශීල - භාවනා වැඩසටහන සහ බුදුන් වැඩි මහියංගන පුදබිමෙහි මෙත්සවිය මගින් තනාගෙන යන අඩි 84 උස බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකිරීමේ කටයුතු අධීක්ෂණය සඳහා වන සදහම් චාරිකාව 2015-02-01 වන ඉරු දින පැවැත්වේ.
- එදින දාන - ශීල - භාවනා වැඩසටහන පැවැත්වෙනුයේ දඹාන මාවරගල ආරණ්‍යය සේනාසනයේ දීය.
- මෙහිදී කොළඹ සිට සහභාගි වන අප සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා අධි සුඛෝපබෝගි සංචාරක බස්රථ 7 ක් පමණ වෙන්කර ඇත.
- බස් රථ 2015-01-31 රාත්‍රී 10.00 ට වැල්ලවත්ත පෙඩ්රිකා පාරේ ශ්‍රී විජයාරාමයෙන් පිටත්වේ. නැවත ශ්‍රී විජයාරාමයට ආපසු පැමිණීම 2015-02-01 වන දින රාත්‍රී 09.00 ට ය.
- පැමිණෙන සියලු දෙනා සිල් සමාදන්වීමට සුදුසු ඇඳුමකින් සැරසී පැමිණිය යුතුය.
- මෙහි දී ගිල්දානය සඳහා තම තමන් විසින්ම පලතුරු වෙනත් අයකුට ද සෑහෙන සේ රැගෙන එන්නේනම් මැනවි. දහවල් දානය සහ ගිලන් පස ද මෙත්සවිය මගින් සැපයීම සඳහා සංවිධානය කරනු ලැබේ.
- මදුරුවන්ගෙන් ප්‍රවේසම් වීම පිණිස මොස්ගාඩ්, අවුටාන් හෝ පැඟිරි තෙල් හා ආලේපන සංවිධායක කමිටුව විසින් සපයනු ඇත. එහෙත් ඔබට අවශ්‍ය නම් එවැනි දේත් රැගෙන ආ හැකිය. ඉඳගෙන භාවනා කිරීම සඳහා ඉටි රෙද්දක්, කුෂන් එකක් හෝ කුඩා කොට්ටයක් වැනි යමක් ගෙන ආවාට කම් නැත. සුඛෝපභෝගී බස් රථවලින් සිදුකරන ප්‍රවාහන ගාස්තු, දිවා ආහාරය හා ගිලන්පස වියදම පියවීම සඳහා වන බරපැන රුපියල් 2,000/= ක් වේ. කප් රුක් පූජාව සඳහා වන දායකත්වය ද ඉහත බරපැනට ඇතුලත් වේ. බස් රථ ආසන වෙන්කිරීම සඳහා සහ මගදී රථවලට නැගීමට බලාපොරොත්තු වන අය මෙත්සවිය කාර්යාලයට හෝ බැඑස් රථ සංවිධායක බී. ඩබ්. චමින්ද මහතා අමතන්න. (දුරකතනය 07777 900 76). **බරපැන වන රුපියල් 2,000/= හෝ අත්තිකාරම් මුදල් 2015-01-18 ට පෙර කාර්යාලයට ගෙවා (දු.ක. 0714 014 467) ආසන වෙන්කර ගැනීම කළ යුතුය. ඉඩකඩ සීමිත බැවින් 25 වන දිනට පෙර හෝ හැකිනම් 18 වන දින වනවිට ඔබට සහ ඔබගේ පවුලේ සහභාගී වන අයට අවශ්‍ය ආසන වෙන්කර ගන්න. ආසන පිරුණ විට 25 ට පෙර දී වුව ද බඳවා ගැනීම් අත්හිටවනු ලැබේ.**
- කාර්යයාලයට පැමිණ මුදල් ගෙවිය නොහැකි දුර බැහැර සිටින අය ආසන තහවුරු කර ගැනීම සඳහා "**මෙත් සවිය**" නමින් ලියූ චෙක්පතක් හෝ මුදල් ඇනවුමක් 2015-01-20 දිනට පෙර කාර්යයාලයට ලැබෙන්නට සලස්වන්නේ නම් මැනවි.
- **සැලකිය යුතුයි :-** මෙහිදී මුළු දිනයම පලතුරු හා ගිලන්පස පමණක් ගත හැකි නම් ඉතා හොඳය. එහෙත් දුර ගමනක් බැවින් දහවල් දානය සඳහා බත් පාර්සල් සපයනු ලැබේ. ඒ අනුව මෙත් සවිය භාවනා පවුල්වල සාමාජිකයින් එක්ව හෝ තනි තනිව හෝ උදේ ආහාරය සඳහා අවශ්‍ය පලතුරු වර්ග රැගෙන එන්න.
- ගිරකළ කුරුල්ලන් නිදහස් කිරීම ද පිං කැට භාරදුන් පිංවතුන්ගේ මුදලින් මෙදින සිදුකරනු ලැබේ.

### කැමති පිංවතුන් හට පහත ආධාර / පරිත්‍යාග සිදුකළ හැක.

මාවරගල ආරණ්‍යය සේනාසනයට... කුඩා භික්ෂූන් වහන්සේලා ඉගෙනගන්නා පිරිවෙනක් සේ පවත්වාගෙන යන බැවින් **ලිපි ද්‍රව්‍ය, සීනි, කිරිපිටි, පාපිසි වැනි ඕනෑම දෙයක්** ධර්මදේශනාවෙන් පසු පරිත්‍යාග කළ හැක.

එහෙත් නායක ස්වාමීන් වහන්සේ පැවසුවේ ආදි වාසින් වෙසෙන දඹාන ගම්මානයේ තනනු ලබන නව භාවනා මධ්‍යස්ථානයේ කුටියක් දෙකක් තැනීම සඳහා භාර ගැනීම/මුදල් පරිත්‍යාග කිරීම වෙනත් කිසිදු පරිත්‍යාගයකට වඩා වටිනා බවය.

**දඹාන ආදී වාසින් වෙත :** රෙදිපිලි, ලුණු, සහල්, සීනි සහ කැකුළන් සඳහා පැණිරස කෑම සහ ලිපි ද්‍රව්‍ය පරිත්‍යාග කළ හැක. එහෙත් නායක වන්නිල ඇත්තන්ගේ ඉල්ලීම වූයේ, මේ කිසිත් නොව දඹාන ගම්මානයේ තනනු ලබන ඉහත භාවනා මධ්‍යස්ථානයේ ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ ශාඛාවක් මෑතක දී රෝපණය කර ඇති අතර, ඒ සඳහා ඇති කණු 60 ක රන් වැටේ කණු කිහිපයකට හෝ මුදල් ආධාර කරන ලෙසය.




2015 /02/01 දිනට නියමිත සඳහම් චාරිකාව සැලසුම්කිරීම සඳහා මහියංගනය (දඹානට) 2015 /01/04 දින මෙත්සවිය සභාපති ඇතුළු පිරිසක් ගිය මොහොතේ ගන්නා ලද ඡායාරූපයක්.

## වැඩසටහන් විස්තරය

### 2015-01-31 සෙනසුරාදා

2015-01-31 සෙනසුරාදා රාත්‍රී 10.00 ට වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් බස්රථ පිටත් වීම

### 2015-02-01 ඉරිදා

| | |
|---|---|
| පෙ.ව.- 4.00 | මහියංගන රාජමහා විහාරයට පැමිණීම. |
| 4.30 - 6.00 | සිල් සමාදන් වීම හා සමූහ භාවනාව/ සක්මන් භාවනාව. |
| 6.00 - 7.00 | කප්රුක් පූජාව සහ කිරි ආහාර පූජාව. |
| 7.00 - 7.30 | ගිල් දානය - පලතුරු පමණි,(කරුණාකර තවත් අයෙකුට ද සෑහෙන සේ පලතුරු රැගෙන විත් දානමය කුසලය ද රැස්කර ගන්න.) පානීය ජලය/තේ පැන් මෙත්සවියෙන් සපයනු ලැබේ. |
| 7.30 - 8.30 | බුදු පිළිමය ඉහළට නැංවීම රත්නපුරේ නන්ද ස්වාමීන් වහන්සේ ඇතුළු පිරිස විසින් ආරම්භය හා අධීක්ෂණය කිරීම. |
| 8.30 - 9.00 | දඹාන මාවරගල ආරණ්‍යය සේනාසනයට ගමන්කිරීම. |
| 9.00 - 9.30 | දඹාන මාවරගල ආරණ්‍යය සේනාසනයේ දී ගිලන් පස ගැනීම. |
| 9.30 - 10.30 | ධර්ම දේශනාව (මලියදේව මහරහතන් වහන්සේ වැඩසිට දම්දෙසූ ගල්තලාව මත). |
| 10.30 - 11.30 | සමූහ භාවනාව. |
| 11.30 - 12.00 | දහවල් දානය (මෙත් සවිය සංවිධායක කමිටුව මගිනි). |
| 12.00 - 1.00 | භාවනා මධ්‍යස්ථානයේ ගල්ලෙන් නැරඹීම. |
| 1.00 - 1.45 | ගල්ලෙන් තුල භාවනා කිරීම. |
| 1.45 - 2.00 | දඹාන වනයේ ආදී වාසී ගම්මානය වෙත ගමන් කිරීම. |
| 2.00 - 3.00 | දඹාන ආදී වාසින් හමුව සහ ඔවුන් වෙත පරිත්‍යාග ලබාදීම. |
| 3.00 - 3.15 | දඹාන ආදී වාසී ජන උරුම විහාරස්ථානය නැරඹීම. |
| 3.15 ට | සිල් පවාරණය. |
| 3.30 ට | මහියංගනයෙන් කොළඹ බලා පිටත්වීම. |
| රාත්‍රී - 9.00 | වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයට ආපසු පැමිණීම. |

# මගඵල ලාභීන් මරණාසන්න අවස්ථාවේ දී, නිරෝධ සමාපත්‍ය සම වැදීම කෙසේ සිදු කරන්නේ ද ?

**නිවන් යාමට අරිඅට මගෙහි යන යෝගාවචරයා විසින් විදර්ශනා භාවනාව හෙවත් ප්‍රඥා භාවනාව සෝවාන් සකෘතාගාමි අනාගාමි හා රහත් ආර්ය සීල ලබන තෙක් එය වැඩිය යුතුය.**

හුදෙක් ආයුඃඵලරානුභාවයට නොව නිරෝධ සමාපත්තියට සමවැදීමෙහි සමර්ථබව ද මේ ප්‍රඥාභාවනාවේ ආනිසංස වේ. ඒ නිරෝධසමාපත්තියේ ස්වාභාවය පහත ප්‍රශ්නවලට සපයාඇති පිළිතුරු කියවා අවබෝධ කර ගන්න.

**(1) නිරෝධසමාපත්ති කවරේ ද ?**
**(2) එයට කවුරුසම වදිත් ද ?**
**(3) කවුරු නො සමවදී ද ?**
**(4) කවර හෙයින් සමවදී ද ?**
**(5) (නිරෝධ සමාපත්තියට) කෙසේ සමවැදීම වේද ?**
**(6) කෙසේ සිටීම වේ ද ?**
**(7) කෙසේ නැගීම වේ ද ?**
**(8) නැගුණහු ගේ සිත කුමකට නැමුණේ ද ?**
**(9) මැරුණහු ගේ ද සමවැදුනහුගේ ද වෙනස කුමක් ද ?**

### (1) නිරෝධසමාපත්තිය කවරේ ද ?

විදශීනානුගත අෂ්ටසමාපත්ති පිළිවෙලින් සමවැදී ඒ සමාපත්තියෙහි ප්‍රතිපක්‍ෂ ධර්‍මයන් නිරුද්ධ කිරීම් වශයෙන් කායාදි ත්‍රිවිධ සංස්කාර පිළිවෙළින් නිරුද්ධ කිරීමෙන් පිරිසිදු කාලයෙහි - චෛතසික ධර්‍මයන් ගේ නෝ පැවැත්ම **නිරෝධසමාපත්ති** නම්,

### (2) එයට කවුරු සම වදී ද ?
### (3) කව්රු නො සමවදී ද ?

අෂ්ටසමාපත්තිලාභී අනාගාමීහු හා ක්‍ෂීණාශ්‍රවයෝ සම වදිති. ශකෘදාගාමී - ශ්‍රෝතාපනනයන් ගේ කාමරාග අප්‍රහීණ හෙයින් සමථ බලය සම්පූර්ණ නො වේ. ඒ සම්පූර්ණ කල්හී සමථ විදශීනා බලද්වයෙන් සමවැදිය යුතු වූ නිරෝධ සමාපත්තියට බල විකලත්‍වයෙන් සමවැදීමට නොහැකි වේ. අනුගාමී හූ ගේ ඒ කාමරාගය ප්‍රහීණ වූ හෙයින් හෙතෙමේ පිරිපුන් බල ඇත්තෝ වේ. එහෙයින් ඕහට **නිරෝධසමාපත්තියට** සමවැදිය හැක යැ. (රහත් ඵලයට පැමිණි කලද) හොඳින් සමවැදිය හැක බොහෝ සමාපත්තියය.

නිරෝධයෙන් නැගිටින අනාගාමී හට නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලචිත්තය අනාගාමිඵල සමාපත්තියට අනන්තර ප්‍රතයෙන්ප්‍රත්‍ය වේ.

### (4) කවර හෙයින් සම වදී ද ?

සංස්කාර ධර්‍මයන් කෙණෙහි කෙණෙහි ඉපදීමෙහි ද, බිඳීමෙහි ද, උකටලී වැ මේ ආත්මයෙහි ම අචිත්තකවැ නිරෝධයට (අනුපාදිශෙෂ පරිනිර්වාණයට) පැමිණියවුන් මෙන් සුවසේ වසම්හ යි සමවදිත්,

### (5) නිරෝධ සමා පත්තියට සමවැදීම කෙසේ වීද ?

අන්‍යෝන්‍ය උපකාරිකවයෙන් ඒකීභාවයට පැමිණි සමථ විදර්ශනා වශයෙන් උත්කෘෂ්ට භාවයට පැමිණ කරන ලද පූර්වකෘතයට ඇති නේවසඤ්ඤායතනය නිරුද්ධ කල යෝගාවචරයා ගේ නිරෝධසමාපත්තියට සමවැදීම වේ.

ශමථ වශයෙන් උක්කෘෂ්ට බවට පැමිනෙන්නේ නේවසඤ්ඤායතනයට පැමිණ සිටී. විදර්ශනා වශයෙන් උත්කර්ෂ බවට පැමිණියෝගී තෙමේ ඵලසමාපත්තියට පැමිණේ. ශමත - විධර්ශනා උභය වශයෙන් උත්කෘෂ්ට බවට පැමිණ පූර්වකෘත්‍ය කොට නේවසඤ්ඤානාසඤ්ඤායතනයට නිරුද්ධ කරන අනාගාමී වූ හෝ අහීත් වූ පුද්ගල තෙමේ නිරෝධ සමාපත්තියට සමවදී.

### මේ විස්තරයයි

**මේ සසුනෙහි නිරෝධසමාපත්තියට සමවදිනු කැමති මහණ තෙමේ බත් කිස නිමවා අත් පා මනැවැ දොවා විවේක තැනෙක මනාව පැනැ වූ අස්නෙකැ පළඟ බැඳ කය සෘජු කොට පිහිටුවා සිහිය කර්මස්ථානභිමුඛ කොට එළවා වැඩහඳී. ඒ භික්‍ෂුව ප්‍රථමධ්‍යානයට සමවැදී එයින් නැගි ඒ ධයානයෙහි වූ සංස්කාරයන් අනිත්‍ය - දුඃක - අනාත්ම හෙයින් මෙනෙහි කිරීමෙන් විදර්ශනා වඩයි.**

**මේ විදර්ශනාව සංස්කාර පරිග්‍රාහක යැ ඵලසමාපත්ති යැ නිරෝධසමාපත්ති යැ ත්‍රිවිධ වේ. මොවුනතුරින් සංස්කාර පරිග්‍රාහක විදර්ශනාව මන්ද වූයේ හෝ තීක්‍ෂණ වූයේ හෝ මාර්ගයට ආසන්න කාරනා වේ. ඵලසමාපත්ති විදර්ශනාව තීක්ෂණවූයේම මාර්ගභාවනාව හා සදෘෂ වුවාම වේ. නිරෝධසමාපත්ති විදර්ශනාව ඉතා මන්ද නොවූයේ ද ඉතා තියුණු නො වූයේද වටී. එහෙයින් මේ අනාගාමී හෝ රහත් වූ හෝ ආර්‍ය තෙමේ ඉතා මද නොවූ ද ඉතා තියුණු නොවූ ද විදර්ශනයෙන් ඒ ප්‍රථමධ්‍යාන සංස්කාරයන් විදර්ශනා කෙරේ.**

ඉක්බිති ද්විතීයධ්‍යානයට සමවැද එයින් නැගී එහි වූ සංස්කාරයන් එසේම විදර්ශනා කෙරේ. ඉක්බිති තෘතියධ්‍යානයට ද -පෙ- ඉක්බිති විඤ්ඤාණඤ්චායතනයට ද සමවැද එයින් නැගී වූ සංස්කාරයන් එසේම විදර්ශනා කෙරේ. නැවැතැ ආකිඤ්චඤ්ඤායතනයට සමවැද එයින් නැගී,

**(අ) නානා බද්ධ අවිකොපනය**

**(ආ) සංඝ පතිමානනය**

**(ඉ) සත්‍ථු පක්කෝසනය**

**(ඊ) අද්ධාන පරිච්ඡේදය යන මේ සතර පූර්ව කෘත්‍යයන් කෙරේ.**

## (අ) නානා බද්ධ අවිකෝපය නම්

ඒ භික්‍ෂුව සමඟ ඒකාබද්ධ වූ පිරිකර හැරුවෙන්වැ සිටි පා සිවුරු ආදිය හෝ ඇඳ- පුටු හෝ වසන ගෙය හෝ අන්කිසි පරිෂ්කාර ජාතියක් හෝ වේ නම් නානාබඩ පරිෂ්කාරයන් ගිනි - දිය - වා - සෝ - මී ආදීන් ගෙන් විනාශ නොවන සේ අධිෂ්ඨාන කළ යුතු බවයි.

**මේ ඉටනසේ යැ (දැන් මෙසේ අධිටන්කරන්න) :-**

මේ මේ දැය මේ සත් දවස ඇතුළත ගින්නෙන් නොදැවේවා. ජලයෙන් නො ඉල්පේවා, වාතයෙන් නො නැසේවා. සොරුන් පැහැර නො ගැනේවා. මීයන් නො කනු ලැබේවා. යි මෙසේ ඉටුකලැ ඒ සත්දවස ඇතුළත ඒ යෝගිහට කිසි උපද්‍රවයෙන් නොවේ. එහෙත් නො යිටන ලද්ද ගිනි ආදියෙන් නසී.

**මහානාග තෙරුවන් මෙනී :-**

මාතෘ උපාසිකාවගේ ගමට පිඩු පිණිස වැඩි තෙරුන් මාතෘ උපාසිකාව කැඳ පිළිගන්වා ආසන ශාලාහි වඩා හිඳුවාය. තෙරහු නිරෝධයට සමවැද වැඩ හුන්හ. උන්වහන්සේ වැඩ සිටියදී ආසන ශාලාව ගිනි ගත්තේය. සෙසු භික්‍ෂූහු තම තමන් හුන් අසුන් ගෙන පලා ගියහ. ගම්වැස්සෝතෙරුන් දැක 'අලස මහණෙකැ' යි කීහ. ගින්න තණ - උණ - දර ආදිය දවා ගෙන තෙරුන් සිසාර සිටියේය. මිනිසුන් කළයෙන් දිය ගෙනවුත් ගිනි නිවා අලු ඉවත් කොට පිරිබඩ ගන්වා මල් විසිරුවා වඳිමින් සිටියහ. තෙරුන් වහන්සේ පිරිසුන් කලයෙහි නැගිට ඔවුන් දැක පළටවුයෙමි යි අහසට නැගී "පුවගු" දිවයිනට වැඩි සේක. **මේය නානාබඩ අවිකොපනය නම්.**

## විශේෂ

ඒකාබද්ධ වු හඳනා පොරෝනා හෝ වැඩහුන් අසුන් හෝ ඉටුවමනා නොවේ. ඒ සමාපත්ති වශයෙන් ම රැකේ. ආයුෂ්මත් සංජීව ස්ථවිරයන්ට මෙනි. ආයුෂ්මත් සංජීව තෙරුන් ගේ සමාධි විෂ්ඵාර ඍධිය වේ. ආයුස්මත් සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ සමාධි විෂ්ඵාර ඍද්ධිය වේය යි එයින් කී.

## (ආ) සංඝපතිමානනය

සංඝයාගේ බුහුමන බැලීමයි. ඒ භික්‍ෂුව එන තෙක් සංඝයා කර්ම නොකිරීමයි. මෙ බහු මුහුමන ඒ භික්‍ෂුව ගේ පූර්වකෘත්‍යය නො වේ. සංඝයා ලේ බුහුමන ආවර්පිනා කිරීම වූ කලී ඒ භික්‍ෂුව ගේ පූර්වකෘත්‍යය.

**ඒ මේසේය :-**

මා සත් දිනක් නිරෝධයට සම වැදි හුන්කල සංඝයා ඤත්තිකර්මාදීන් අතුරින් කිසි කර්මයක් කරනු කැමති වේ නම් කිසි භික්‍ෂුවක් අවුත් මා කැඳවත්ම නැගී සිටිමැයි' ඉටිය යුතු. එසේ ඉටා සමවන්නේ එකල නැගී සිටීම යි. එහෙත් එසේ නො ඉටා සමවන් කලැ සංඝයා රැස්වී ඒ භික්‍ෂුව නො දැක කොහිදැ යි විචාර නිරෝධනයට සමවැදී යි කීකල යා 'අසුවන් භික්‍ෂුව සංඝයා ගේ වචනයෙන් කැඳවයි.' කිසියම් භික්‍ෂුවක් යැවී නම් ඒ භික්‍ෂුව ද ශ්‍රවණොපචාරයෙහි සිට 'ඇවැත්නි සංඝයා ඔබට බුහුමන් කෙරේය යි' කී පමණින් ම නැගීම වේ. මෙසේ සංඝාඥාව ඉතා ගරු යැ. එහෙයින් ඒ ආවර්ජනා කොට තමා ම නැගිටිනා සේ ඉටා සමවැදිය යුතු.

## (ඉ) සත්‍ථු පක්කෝසනය

මෙහිදී ශාසතෘන් වහනසේගේ ආමන්ත්‍රණය ආවර්ජනා කිරීම එහි කෘත්‍යය යි. එහෙයින් හෙද ආවර්ජනා කළයුතු. මා නිරෝධයට සමවැද සිටිනා සත් දවස තුළ බුදුහු අවතීර්ණ වස්තුවෙහි ශික්‍ෂාපද හෝ පනවත් නම් එබඳු කරුණෙක හෝ දහම් දෙසත් නම් කිසිවකු අවුත් මා නො කැඳවන තෙක් (කැඳ වූ කෙනෙහි ම) නැගී සිටිමි' යි. මෙසේ ආවර්ජනා කොට හුන් ඒ භික්‍ෂුව ගේ එකෙනෙහි නැගීසිටීම යි. එහෙත් යමෙක් එසේ නො නො කෙරේනම් බුදුහු සංඝයා රැස් වූ කලැ ඒ භික්‍ෂුව නො දැක 'අසුවල් මහණ කොයිදැ යි' විචාරා නිරෝධයට සමවැදිය යි කී කල යව ගොස් මා වචනයෙන් අසුවල් භික්‍ෂුව කැඳව යි' කිසියම් භික්‍ෂුවක් යවත් නම් ඒ භික්‍ෂුව ද ගොස් ශ්‍රමණාපචාරයෙහි සිට 'බුදුහු ආයුෂ්මතුන්ට ආමන්ත්‍රණය කෙරෙතැ යි' කී කෙනෙහි ම නැගිටීම වේ. මෙසේ බුදුධ නිමන්ත්‍රණය ගුරු යැ. එහෙයින් එය ආවර්ජනා කොට තමාම නැගිටින සේ ඉටා සමවැදිය යුතු.

## (ඊ) අද්ධාන පරිච්ඡේද

**ජීවිතය පවත්නා කාලය පිරිසිඳීම යි.**

**ඒ මෙසේයි :-**

මේ භික්‍ෂුව කාලය පිරිසිඳීමෙහි මනාසේ දක්‍ෂ විය යුතු. තමා ගේ ආයු සංස්කාරය සතියක් පවතීදෝ නොපවතීදෝ යි ආවර්ජනා කොටම සමවැදිය යුතු. එසේ ආවර්ජනා නො කොට සමවැඳුන නිරෝධ සමාපත්තිය ඒ භික්‍ෂුව ගේ මරණය වැළකීමට සමර්ත නො වේ. නිරෝධය ඇතුළත මරණය ද නොවන හෙයින් අතරම සමාපත්තීන් නැගිටීම නො වේ. එහෙයින් මේ අද්ධාන පරිච්ඡේදය ද ආවර්ජනා කොට ම සමවැදිය යුතු. සෙසු දැය ආවර්ජනා නො කිරීමට ද වටී. මේ අධාන පරිච්ඡේදය වූ කලී ආවර්ජනා කටයුතුමැ යි.

ඒ යෝගී තෙමේ පෙර කී සේ ආකිඤ්චඤ්ඤායතනයට සමවදී. එකැල සිත එක්වරක් හෝ දෙවරක් හෝ ඉක්ම අචිත්තයක වේ. නිරෝධයට සමවදී. (නිරෝධ නම් වූ නිර්වානය ස්පර්ශ කෙරේ)

## විශේෂ

ඒ භික්‍ෂුවගේ සිත චිත්තවාර දෙකකට වඩ කවර හෙයින් නො පවතීද යත් ? නිරෝධය පිණිස ප්‍රයෝග හෙයිනි. මේ මහණහු ගේ ශමථ - විදර්ශනා ධර්ම දෙක සම කොට

අෂ්ටසමාපත්ති වශයෙන් නැගීම අනුපූර්ව නිරෝධය පිණිස ප්‍රයෝගයෙකි. නේවසඤ්ඤායතන සමවතට ප්‍රයෝග නොවන හෙයිනි. නිරෝධයට ප්‍රයෝග වන හෙයින් දෙසිතකින් මත්තෙහි සිත් නොපවතී.

යම් භික්‍ෂුවක් ආකිඤ්චඤ්ඤායතනයෙන් නැගී මේ පූර්ව කෘත්‍යයන් නොකොට නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවදී නම් හෙතෙමේ මත්තෙහි ඒ පිරිසිඳ කාලයෙහි අචිත්තක් වන්නට නො පොහොසත් වේ. පෙරලා ආකිඤ්චඤ්ඤායතනයට පිහිට යි. (නැවත ආකිඤ්චඤ්ඤායතනයට සමවැදී එයින් ගේ උපමා යෙදේ.

පෙර නො ගිය විරූ මගෙකැ යන පුරුෂයෙක් අතර මග දිය විලක් හෝ ගැඹුරු දිය කඳු රැලියක් හෝ ගැමුරු මඩවලක් හෝ ඉක්ම සිටි සැඩ අවුවෙන් තැවුණු ගලකට හෝ පැමින හඳන පොරෝනා නොපටවා ම ඒ කඳුරටබැස පිරිකර තෙමෙන බියෙන් නැවැත ද තීරයෙන් පිහිටා පාෂාණය හෝ ඇක්ම තැවුණු පා ඇතිවැ නැවැත ද මෙතෙර සිටියේ වෙයි. එහි ඒ පුරුෂයා නො පටවන ලද හඳනා පොරෝනා ඇති හෙයින් කඳුරට බට කෙණෙහි ම හෝ පහණ ඇක්මුණු කෙනෙහි ම හෝ පෙරළා අවුත් මෙතෙර සිටුනා සේ ඒ යෝගී ද පූර්වකෘත්‍යයන් නො කළ හෙයින් නේවසඤ්ඤානාඤ්ඤායතනයට සවනක් කෙණෙහි ම පෙරළා අවුත් ආකිඤ්ඤායතනයෙහි පිහිටයි.

පෙර ද මඟ ගිය පුරුෂයෙක් එතැනට පැමිණ එක් සළුවක් තරවැ හැඳ අනෙක් සළුව අතින් ගෙන කඳුර ඉක්මවා හුනු පහණ ඇක්මුණු පමණක් ම කොට ඈතට යන්නා සේ පූර්ව කෘත්‍යයන් කළ ඒ මහණ නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැද මත්තෙහි අචිත්තක වේ. සමවැද වෙසේ.

## (6) කෙසේ සිටීම වේද?

මෙසේ සමවන් ඒ නිරෝධ සමාපත්තිහු ගේ කාලපරිච්ඡේද වශයෙන් ද අතරතුර ආයුක්‍ෂය යැ, සංඝයා ගේ බුහුමන යැ, ශාස්තෘ ආමන්ත්‍රණය යැ යන මොවුන් ගේ අභාවයෙන් ද සිටම වේ.

## (7) කෙසේ නැගීම වේද?

අනාගාමීහු ගේ අනාගාමී ඵලොප්පත්තියෙන් ද, රහත්වහු ගේ අර්හත් ඵලොතප්ත්තියෙන් ද, හැගීම වේ.

## (8) නැගණුහු ගේ සිත කුමකට නැගුනේ වේ ද?

නිරෝධයෙන් නැගෙන්නහු ගේ සිත නිර්වාණයට නිම්න වූයේ වේ එයින් වදාළහ. සඤ්ඤවේදයිත නිරෝධ සමාපත්තියෙන් නැගි භික්‍ෂුව ගේ සිත සර්වසංස්කාරයෙන් කෙරෙන් විවික්ත හෙයින් විවේක නම් වූ නිර්වාණයට නැමුණෝ වේ. විවේකයට ප්‍රවන වේ විවෙක ප්‍රාග්භාර වේ.

## (9) මළහු ගේ ද, නිරෝධසමාපත්තියට සමවන්නහු ගේ ද වෙනස කුමක්ද?

කළුරිය කළහුගේ කායසංස්කාරයෝ නිරුද්ධයහ. පිංසිඳුණාහ. වාක්සංස්තාරයෝ ද, චිත්තසංස්කාරයෝ ද, නිරුද්ධයහ. සංසිඳුණාහ. ආයුෂ (ජිවිතන්ද්‍රි) ය ක්‍ෂය වී උෂ්මාව (කම්මජතෙජො ධාතුව) සන්සිඳිණ. චක්‍ෂුරාදි ඉන්ද්‍රියයෝ බිඳුණාහ.

සඤ්ඤවේදයික නිරෝධයට සමවන් භික්‍ෂුව ගේ ද කායසංස්කාරයෝ නිරුද්ධයහ. සිංසිඳුණාහ. වාක් චිත්ත සංස්කාරයෝ ද නිරුද්ධයහ. සංසිඳුණාහ. ආයුෂය ක්‍ෂය නො වී, උෂ්මාව නො සංසිඳිණ. ඉන්ද්‍රියෝ නො බිඳනාහ. ඔවුනු දෙදෙනාගේ වෙනස මෙයයි.

## මරණය මත්තෙහි කුමක් වේද ?

(1)

සෝවාන් සකෘර්දාගාමී අනාගාමී අරහත් යන සතර මාර්ග අතුරින් පළමුවන සෝවාන් මඟ නුවණ වඩා මඳ වූ විදර්ශනාවෙන් සෝවාන් බවට පැමිණි ශ්‍රද්ධාදි මෘදු වු ඉඳුරන් ඇත්තේ ම (දෙව් ලොව මිනිස් ලෝ විසින්) සත් සුගති භවයකැ ප්‍රතිසන්ධි වශයෙන් සසර ඇවිද දුක් කෙළවර කරන්නේ **සත්තකබත්තුපරම** නම් වේ.

මධ්‍යම විදර්ශනාවෙන් ආගත වූ ශ්‍රද්ධාදි මධ්‍යම ඉන්ද්‍රයයන් ඇතියේ කුල දෙක තුනක පිළිසිඳීම් විසින් සසර සැරුසරා දුක් කෙළවර කරන්නේ **කොලංකොලනම්** වේ.

තියුණු විදසුනෙන් ආගත වූ තියුණු ශ්‍රද්ධාදි ඉඳුරව් ඇත්තේ එකම ප්‍රතිසන්ධියක් ලැබ සසර දුක් කෙළවර කරන්නේ **ඒකබීජ** නම් වේ.

**කලෙකැ දෙව් ලොව ද, කලෙකැ මිනිස් ලොවැදැ යි මිශ්‍රක වශයෙන් සුගති භව සතෙකැ ඉපදීම සත්තක්ඛත්තුපරමතාව යැ. කොලංකොලභාවය ද මනුෂ්‍ය - දිව්‍ය ලෝකයන්හී මිශ්‍රවැ ඉපදී දුක් කෙළවර කිරීමයි. මෙහි කුල වශයෙන් ගැනෙණුයේ මහාසාරකුලමැ යි. හෙද කුල දෙක තුනෙකැ යි කිව ද භව සය තෙක් ද ඉපදිය හැකි යි. මිනිස් ලොව හෝ දෙව් ලොව හෝ එකම අත්බවක් ලබා දුක් කෙළවර කිරීම ඒකබීජිය. (මේ වූකලී ත්‍රිවිධ මාර්ගවිදර්ශනාවන් ගේ වශයෙන් නියමය වේ. මතු තුන්මග විදර්ශනා බලවත් වී නම් එකබීජ වේ. මධ්‍යම වී නම් කොලංකොලම ද, මන්ද වී නම් සත්තකබත්තුපරම ද වේ.)**

(2)

**දෙවන (ශකෘදාගාමි) මාර්ගඥාව වඩා එක්වරක් ම මිනිස් ලොවට අවුත් දුක් කෙළවර කරන්නේ සකෘදාමි වේ.**

(මේ වූ කලී පස්වැදෑරුම් ශකෘදාගාමීන්ගේ අන්තය යැ.)

**ඒ මෙසේයි :-**

**කෙනෙක් මෙහිදී සකෘදාගාමි ඵලය ලබා මෙහිම පිරිනිවෙති. කෙනෙක් මෙහි සකෘදාගාමිවැ දෙව්ලොව ඉපිද එහිදී පිරිනිවෙති. කෙනෙක් දෙව්ලොව සකෘදාගාමිවැ එහිදීම ..පිරිනිවෙති. කෙනෙක් දෙව්ලොව සකෘදාමිවැ මෙහි ඉපිද මෙහිදී පිරිනිවෙති.**

(3)

**තුන්වන මාර්ගප්‍රඥව වඩා ආගාමි වේ. හේ ප්‍රතිසන්ධි වශයෙන් මෙහි නුපදනා හෙයින් එනම් වේ.**

• අනාගාමීතෙම යම්කිසි ශුද්ධාවාසයෙකැ ඉපිද එහි ආයු ප්‍රමාණයෙන් මධ්‍යයට නො පැමිණ පිරිනිවෙනුයේ **අන්තරාපරිබ්බායි යැ.**

• ආයු මධ්‍යය පසු කොට පිරිනිවෙනුයේ **උපබච්චපරිනිබ්බායි යැ.**

• නිරුත්සාහයෙන් මාර්ග උපදවා පිනිවෙනුයේ **අසංඛාර පරිනිබබායි යැ.**

• උත්සාහයෙන් මතු මාර්ග උපදවනුයේ **සසංඛාරපරිනිබ්බායි යැ.**

• උපන් ශුධාවාස ශූමියෙන් ක්‍රමයෙන් මතු - මතු ලෝකයට යමින් අකණිටාව තෙක් යන්නේ **උඩංසොතඅකණිට්ඨගාමී යැ.**

• තවද අවිහාදි පිළිවෙළින් අකණිට්ඨකය තෙක් (පිළිවෙලින්) ගොස් එහිදී අකණිට්ඨකයට නො පැමිණිනි සුදස්සිය තෙක් යට සිවු බඹලොවෙහි සැරිසරා පිරිනිවෙනුයේ උඩංසොත නම්

• අකණිඨයෙහිම ඉපිද පිරිනිවෙනුයේ න **උඩංසොත අකණඨගාමී යැ** යි මෙසේ උඩංසොත අකණිට්ඨගාමිහු සතර දෙනෙකි. මේ එකම චතුෂ්කයක් සේ ගැනෙණි.

(4)

සිව් වැනි මාර්ග ප්‍රඥව (ආර්‍යය) වඩා කසි කෙනෙක් ප්‍රඥවිමුක්ත වෙති.

කිසි කෙනෙක් උභතෝභාවිමුකිත වෙති.

කිසි කෙනෙක් ෂඩභිඥ වෙතී.

කිසි කෙනෙක් ප්‍රතිසම්භිදා ප්‍රභේදගත මහාක්ෂිණාශ්‍රව වෙත්.

මෙහෙයින් "මග්ගක්ඛණෙ පනෙතං ජටජ විජටෙති නාම ඵලක්ඛණෙ විජ්ටිතජටො සදෙවකස්ස අග්ගදක්ඛිණෙයෙ‍යා හොතී" ආර්‍යයන් වන සතර වන මාර්ග ක්‍ෂණයෙහිම ජටා විජටනය කෙරේ නම් ඵල ක්‍ෂණයෙහි සුදුසු සේ ජටා විජටනය කෙළේ සදේවක ලෝකයාටඅග්‍රදක්‍ෂිණාර්හී වේය.

*රේරුකානේ චන්දවිමල හිමි ගේ ග්‍රන්ථයක් ඇසුරෙන්*
*මහාචාර්ය චන්දන ජයරත්න විසින් සකසන ලදී.*

සිතුවිලි වලට ඉඩ දී පොර බඳන්නට
මට බැහැ තවත් මේ සසරෙහි විඳින්නට
බුදු හිමි දෙසූ ඒ ගමනෙහි යෙදෙන්නට
ආසයි මටත් මහණව පිං පුරන්නට

**(එම්.කේ. ප්‍රියන්ත - 18 - 2962)**





දිවියේ අනේක වූ
දුක් කම්කටොලුවලින්
සිත විඩාපත් වූ සැම විටම
සිහිකරමි
"යෝගී චින්තා"

සුවපත් වේය සිත
ඒ තුළින් බොහෝ සේ
මෙවන් මගක් කියා දුන්
"මෙත්සවිය" ගුරුතුමනි
ඔබට පිං...

**සාමාජික අංක 102**

# දෙනු මැන වරම්

*සමථ විදසුන් වඩන්නට,*
*ජීවිතය විනිවිද දකින්නට,*
*ජීවන දැක්මක් ඇති කරන්නට,*
*සමත් විය 'මෙත් සවිය'.......*

*මෙතෙක් ආ දුර කෙටි මුත්,*
*යා යුතු මග බෙහෝ ඇත,*
*අවසන් පැතුම.......*
*නිර්වාණය තෙක්*

*සසර කතරෙහි සැරිසරන තෙක්*
*පෙර පව් දුරලන්නට*
**ඇදුරාණනි,**
**දෙනු මැන වරම්...**

**තන්දනී බණ්ඩාර මහත්මිය (6-1080)**



මහියංගනය 2600
සම්බුද්ධත්ව ජයන්තිය
සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ

**ඉදිකිරීමේ කමිටුව**

**පැවිදි අනුශාසකවරු**

● වැල්ලවත්ත ශ්‍රී විජයාරාමාධිපති ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත වංසාලංකාර අමරපුර ධම්මරක්ඛිත නිකායේ ප්‍රධාන අධිකරණ සංඝ නායක **අතිපූජ්‍ය අහංගම ආනන්ද මහා ස්වාමීන් වහන්සේ.** දු.ක. : 0112581758

● අස්ගිරි මහා විහාර පාර්ශවයේ ජ්‍යෙෂ්ඨ කාරක සංඝසභික ඓතිහාසික මහියංගන රාජමහා විහාරයේ භාරකාර **අතිපූජ්‍ය උරුලෑවත්තේ ධම්මරක්ඛිත ස්වාමීන් වහන්සේ.** දු.ක. 0552257235

**ගිහි අනුශාසක**

මෙත්සවිය නිර්මාතෘ සහ එහි සභාපති ශාසන දීපන, විද්‍යා කීර්ති **මහාචාර්ය චන්දන ජයරත්න මහතා** දු.ක. : 0714 800800

**විධායක කමිටුව**

පොලිස් පරීක්ෂක ඒ. එන්. පී. මෙන්ඩිස් **(ගරු සභාපති)** - 0718 266143, ජේ. එස්. දිනුකා **(ගරු ලේකම්)** 0714 553435, ඩබ්. ඩබ්. රණසිංහ **(ගරු භාණ්ඩාගාරික)** - 0714 297681

**ක්‍රියාකාරී කමිටුව**

පී. පී. පෙරේරා **(ගරු සභාපති)** - 0712 341012, එස්. එම්. ඩී. කිංස්ලි පෙරේරා **(ගරු ලේකම්)** - 0714 272735, එච්. ඩබ්. ජයසිංහ, එච්. ආර්. සොයිසා, ඩී. සී. ඒ. එස්. පත්මතිලක, එස්. පී. පියරත්න, එන්. අබේපිටිය, ජගත් සෙනෙවිරත්න, ටී. එච්. සමන් උදයසිරි, ඒ. එන්. පී. මැන්ඩිස්, එල්. ඒ. අජිත් සුදත්සන, පර්සි අභයරත්න, එම්. ටී. එන්. පුෂ්ප කුමාර, එම්. ඩී. යූ. එම්. ජයතිලක, සුපුන් ඒකනායක, එම්. එච්. හෙරන් ඉන්දික, බී. ඩබ්. චමින්ද, නාලක ප්‍රියදර්ශන, එච්. ඩී. දිලාන් මධුංග, අමිල පෙරේරා, එස්. පී. නුවන් චතුරංග.

පිළිමය තැනීම නිම කිරීමට
ඉමහත් සේ වෙහෙසෙන ඉහත කමිටුවලට
අපගේ ආශිර්වාදය හිමි වේ.

# සීලයේ පිහිටුවීම

**උපාසක / උපාසිකා**

ඕකාස අහං භන්තේ තිසරණේන සද්ධිං
අට්ඨාංග සමන්නාගතානී සීලානි ධම්මං
යාචාමි අනුග්ගහං කත්වා
සීලං දේථ මේ භන්තේ

දුතියම්පි ඕකාස අහං භන්තේ - පෙ
තතියම්පි ඕකාස අහං භන්තේ - පෙ
අනුකම්පං උපාදාය

## නමස්කාර පාඨය කියවීම

**සිල්දෙන භික්ෂුව**

යමහං වදාමි තං වදේථ
(මම යමක් කියම් ද, එය කියවන ආකාරයට කියන්න යැයි පවසයි)
ආම භන්තේ

## පින් අනුමෝදන් වීම හා පිං අනුමෝදන් කරවීම

**උපාසක/උපාසිකා**

ඕකාස වන්දාමි භන්තේ / මයා කතං පුඤ්ඤං
සාමිනා අනුමෝදිතබ්බං

**භික්ෂූන් වහන්සේ** - සාදු සාදු අනුමෝදාමි

**උපාසක/උපාසිකා**

සාමිනා කතං පුඤ්ඤං - මය්හං දාතබ්බං

**භික්ෂූන් වහන්සේ** - සාදු සාදු අනුමෝදාමි

**උපාසක/උපාසිකා**

සාදු සාදු අනුමෝදාමි - ඕකාස ද්වාරත්තේන
කතං සබ්බං අපරාදං - ඛමත මේ භන්තේ

**භික්ෂූන් වහන්සේ** - කමාමි ඛම් තබ්බං

**උපාසක/උපාසිකා** - ඕකාස ඛමාමි භන්තේ

**සංඝරත්නයට වඳින විට මෙසේ කියන්න.**

සීලවතං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබේන මහා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරි පුත්තාදි ථෙරානං - ආගති පටිපාටියා
සද්ධා සීලං දයාවාසං - බුද්ධපුත්තං නමාමහං

සිල්වත් වූ, ගුණවත් වූ, උපමා කළ නොහැකි පින්කෙතක් වූ, දුර්ලභයෙන් මැනවින් ලබන ලද, දැකීමට හා වැඳීමට අතිශයින් යෝග්‍ය වූ, සැරියුත් ආදී මහරහතුන් වහන්සේලා ගිය මඟ ගමන් කරන්නා වූ, සද්ධාවෙන්, සීලයෙන්, දයාවෙන් යුක්ත වූ, බුද්ධපුත්‍රයන් වහන්සේලාට මම නමස්කාර කරමි.



# ඓතිහාසික මහියංගන රාජමහා විහාර පුදබිමෙහි අඩි 84 ක් උසැති සම්බුද්ධජයන්ති බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම සඳහා 2014. 04. 01 සිට 2014. 12. 31 දක්වා ආධාර කළ පිංවතුන්ගේ නාම ලේඛනය

| ටිකට් පත් අංකය | නම | මුදල |
|---|---|---|
| | **හිටපු ප. නි. මහතමියගේ පොත් අනුව** | |
| 122/249/250 | එල්. හේමලතා මිය. | 15,000/- |
| 209 | අමිල පෙරේරා මයා. | 1,000/- |
| 210/281 | එස්. එස්. කටුගම්පොල මිය. | 2,000/- |
| 282/283 | ඩී. ඩී. ඉන්ද්‍රාණි මිය. | 2,000/- |
| 102 | ප්‍රියන්කා ජයසිංහ මිය. | 5,000/- |
| 476 | කල්‍යාණි අංගමන මිය. | 10,000/- |
| 284/285 | එරංගා රණවක මිය | 2,000/- |
| 769 | එස්. එස්. කටුගම්පොල මිය. | 500/- |
| 770 | ඩී. ඩී. උපවංස මයා. | 500/- |
| 771 | පුෂ්පා වීරසේකර | 500/- |
| 772 | යසරත්න මයා. | 500/- |
| 286/287 | කෝසල එදිරිසිංඝ මයා. | 2,000/- |
| 288 | බුමිත බහසිලු මයා. | 1,000/- |
| 51 | පියසීලි තෙබුවන මිය. | 100,000/- |
| 477 | ධම්මිකා ලියනගේ | 10,000/- |
| 478 | පී. බී. මහ දිවුල් වැව | 10,000/- |
| 290/291/292 | එස්. එස්. කටුගම්පොල මිය. | 3,000/- |
| 293 | ආර්. කන්දගේ | 1,000/- |
| - | හෂාන් හෙශාන්ත මයා. | 5,000/- |
| 294/295 | එස්. බටගොඩ මයා. | 2,000/- |
| 773 | කේ. මිහිරාපිනි මිය. | 500/- |
| - | තරංගනී විජේසිංහ මිය. | 50,000/- |
| 296 | කේ. රණසිංහ මයා | 1,000/- |
| 297 | සෝම දීගල්ල මිය. | 1,000/- |
| 477/478/479 | නම සඳහන් කර නැත. | 30,000/- |
| | **2014/09/21 සිට ක්‍රියාකාරී කමිටුව මගින් නිකුත් කළ ටිකට්** | |
| | විපුලි දර්ශිකා මිය. | 1,000/- |
| | සිරිපාල රණතුංග මයා. | 1,000/- |
| | මායා සමරකෝන් මිය. | 1,000/- |
| | පරිත්‍යාග | 1,000/- |
| | සිරිපාල රණතුංග මයා. | 5,000/- |
| | ඉන්ද්‍රාණි පෙරේරා මිය. | 5,000/- |
| | බුවනෙක ගීකියනගේ මයා. | 5,000/- |
| | ඩී. සී. ඒකනායක මිය. | 50,000/- |
| | **පරිත්‍යාග** | |
| | චමිලා දෙනගම | 50,000/- |
| | තිස්ස ජයවර්ධන මයා. | 75,000/- |
| | එස්. සමරසේන මයා. | 25,000/- |
| | නිහාල් ජයතිලක මයා. | 200,000/- |
| | ප්‍රියන්ත ද සිල්වා මයා. | 100,000/- |
| | කේ. ලීලානන්ද මයා | 25,000/- |
| | විනිල් මැණික් අධිපතිතුමා | 30,000/- |
| | නලින් මැණික් අධිපතිතුමා | 30,000/- |
| | මානෙල් ප්‍රනාන්දු මිය. | 100,000/- |
| | ශිරන්ත ඉල්ලංගරත්න මයා. | 25,000/- |
| | වෛද්‍ය කාංචන ඇලපාත මයා. | 100,000/- |
| | මාලනී පේමරතන මිය. | 100,000/- |
| | සුජිත් පෙරේරා මයා. | 100,000/- |
| | මනුක හරින්ද්‍ර මයා. | 100,000/- |
| | එම්. පෙරේරා මිය. | 1,000/- |
| | එස් පල්ලිගුරුගේ මයා. | 2,000/- |
| | ප්‍රේමලතා රත්නායක මිය. | 500/- |
| | සී. දියග මයා. | 500/- |
| | චන්ද්‍ර ජයසේකර මිය. | 500/- |
| | විශ්වනාත් අපොන්සු මයා. | 500/- |
| | එල්. කුමාරිහමි මිය. | 500/- |
| | වජිරා සිරිසූරිය මිය. | 500/- |
| | **රුපියල් 100 ටිකට් පොත් විකුණා දුන් සාමාජිකයන්** | |
| 0001-0025 | ආර්. රත්නතිලක මයා. | 2,500/- |
| 0026-0050 | බී. දිසානායක මයා. | 2,500/- |
| 0176-0200 | එම්. පැස්කුවල් මයා. | 2,500/- |
| 0201-0250 | මාලනී ප්‍රේමචන්ද්‍ර මිය. | 2,500/- |
| 0251-0275 | ඩී. එස් . දිසානායක මයා. | 2,500/- |
| 0276-0300 | දේවිකා කොඩිතුවක්කු මිය. | 2,500/- |
| 0301-0325 | කමල කොඩිතුවක්කු මිය. | 2,500/- |
| 0326-0350 | නිහාල් පුංචිහේවා මයා. | 2,500/- |
| 0351-0375 | ශානි නිමේෂා මිය. | 2,500/- |
| 0376-0400 | ආර්. පෙරේරා මයා. | 2,500/- |
| 0401-0425 | ශානි නිමේෂා මිය. | 2,500/- |
| 0426-0450 | ධර්ශනී ගිනිගේ මිය. | 2,500/- |
| 0451-0475 | දමයන්ත නන්දකුල මිය. | 2,500/- |
| 0476-0500 | ප්‍රීතිකා පීරිස් මිය. | 2,500/- |
| 0501-0525 | බණ්ඩාර මැණිකේ මිය. | 2,500/- |
| 0526-0550 | ඩී. රන්ජන් මයා. | 2,500/- |
| 0556-0575 | බී. පතිරාජ මයා. | 2,500/- |
| 0626-0650 | පරිත්‍යාග | 2,500/- |
| 0651-0675 | එස්. සුරවීර මයා. | 2,500/- |
| 0676-0700 | කිත්සිරි මයා. | 2,500/- |
| 0726-0751 | ප්‍රියන්ති පෙරේරා මිය. | 2,500/- |
| 0851-0875 | චන්ද්‍ර ජයසේකර මිය. | 2,500/- |
| 0901-0925 | රූපා පෙරේරා මිය. | 2,500/- |
| 0926-0950 | නිහාල් මයා. | 2,500/- |
| 1001-1025 | ජේ. විජේසිංහ මයා. | 2,500/- |
| 1101-1125 | ඩබ්. ගුණරත්න මයා. | 2,500/- |
| 1126-1150 | රන්ජිත් ඇලපාත මයා. | 2,500/- |
| 1151-1175 | මංජුල පෙරේරා මයා. | 2,500/- |
| 1251-1275 | බී. විමලසේන මයා. | 2,500/- |
| 1351-1375 | ඒ. සමරදිවාකර මයා. | 2,500/- |
| 1376-1400 | වී සමරකෝන් මයා. | 2,500/- |

| ටිකට් පත් අංකය | නම | මුදල |
|---|---|---|
| 1425-1450 | එන්. විජේරත්න මයා. | 2,500/- |
| 1451-1475 | ලතා අබේකෝන් මිය. | 2,500/- |
| 1501-1525 | එම්. වික්‍රමාරච්චි මයා. | 2,500/- |
| 2275-2300 | එස්. නිමේෂා මිය. | 2,500/- |
| 2301-2350 | ඩිලාන් මදුරංග මයා. | 2,500/- |
| 2351-2375 | කිත්සිරිමෙවන් මයා. | 2,500/- |
| 2376-2400 | එම් ලියනාරච්චි මයා. | 2,500/- |
| 2476-2500 | ශ්‍රියානි මිය. | |
| 2501-2525 | චමලි අමදෝරු මිය. | 2,500/- |
| 2551-2600 | නිල්මිණි සඳමාලි මිය. | 2,500/- |
| 2926-2950 | අනුරාධ දයාරත්න මයා. | 2,500/- |
| 3026-3050 | විපුල් ප්‍රියශාන්ත මයා. | 2,500/- |
| 3676-3700 | විපුල් ප්‍රියශාන්ත මයා. | 2,500/- |
| 3701-3725 | එරන්ද බුද්ධිකුමාර මයා. | 2,500/- |
| 4501-4525 | ඩබ්. පෙරේරා මයා. | 2,500/- |
| 4526-4550 | වසන්ත පුෂ්පකුමාර මයා. | 2,500/- |
| රුපියල් 250 ටිකට් පොත් විකුණා දුන් සාමාජිකයන් | | |
| 026-050 | එන්. විජේකුල සූරිය මයා. | 6,250/- |
| 051-075 | එස්. කොඩිතුවක්කු මයා. | 6,250/- |
| 101-125 | එල්. තිලකරත්න මයා. | 6,250/- |

| ටිකට් පත් අංකය | නම | මුදල |
|---|---|---|
| 126-150 | මහේෂිකා දේවසුරේන්ද්‍ර මිය. | 6,250/- |
| 151-175 | දේවිකා හේවාගම | 6,250/- |
| 251-275 | සසංක විජේරත්න | 6,250/- |
| 301-325 | චන්ද්‍රිකා සුවාරිස් | 6,250/- |
| 376-400 | වරුණ සම්පත් මයා. | 6,250/- |
| රුපියල් 500 ටිකට් පොත් විකුණා දුන් සාමාජිකයන් | | |
| 026-050 | කේ. නිමල රත්න මයා. | 12,500/- |
| 101-125 | සසංක විජේරත්න | 12,500/- |
| 351-375 | වරුණ සම්පත් මයා. | 12,500/- |
| රුපියල් 1000 ටිකට් පොත් විකුණා දුන් සාමාජිකයන් | | |
| 021-030 | හර්ෂ ජයවීර මයා. | 10,000/- |
| 031-040 | හර්ෂ ජයවීර මයා. | 10,000/- |
| 041-050 | පී. පී. පෙරේරා මයා. | 10,000/- |
